www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බැංකොක් නගරයේ මහා ලේ වැගිරීම අනතුරු හැඟවීමකි

## Bangkok's bloody events: a warning

**2010 මැයි 22**

තායිලන්තයේ ආන්ඩු විරෝධී පෙලපාලිකරුවන්ට ගතවූ සතියේ තායි හමුදාව එල්ල කල මර්දනය පිලිබඳ ජාත්‍යන්තර බලවතුන්ගේ මොනම හෙලාදැකීමක්වත් නොතිබීම වනාහී දැන් උග්‍රවෙමින් පවතින්නා වූ පන්ති විරෝධතා මැඬලීමට ලෝකය පුරාම එයාකාරම මර්දනයන් යොදාගනු ලබනු ඇති බවට කම්කරු පන්තියට කෙරෙන දරුනු අනතුරු හැඟවීමකි.

බැංකොක් නගරයේ වානිජ ප්‍රදේශයේ මාස දෙකක් තිස්සේ කඳවුරු බැඳගෙන සිටි 'ඒකාධිපතිත්වයට එරෙහි ප්‍රජාතන්ත්‍රවාදය' (යූඩීඩී) නම් ලද විරෝධතා ව්‍යාපාරය මර්දනය කිරීම බර අවි ගත් හමුදාව ද සන්නද්ධ රථ ද යොදා 19 බදාදා එල්ල කරන ලද ප්‍රහාරයකින් කුලුගන්වනලදි. විරෝධතාවේ සෑම ලකුනකටම දුටුතැන වෙඩි තැබූ ආන්ඩුවේ සොල්දාදුවෝ අඩු ගනනේ 15ක් මරා දමා 400කට අධික සංඛ්‍යාවකට තුවාල කලහ. දුරසිට ඉලක්කයට වෙඩි තබන හමුදා භටයෝ සෙනග මැද සිටි පුද්ගලයන් තෝරතෝරා වෙඩිතබා මැරීම විශේෂයෙන්ම දක්නට ලැබුනු දෙයකි. දැනට ද ස්ථානයේ සැලකියයුතු හමුදාවක් රඳවා ඇත. අගනුවර පුරාම ද රටේ පලාත්වලින් තුනෙන් පංගුවක ද හදිසි තත්වයක් ද අඳුරු නීතිය ද පනවා තිබේ. විරෝධතා ව්‍යාපාරය තුල දී පන්ති බෙදීම් කැපීපෙනෙන ලෙස ඉස්මත්තට ආවේ ය. විරෝධතාවයට වෙඩිතැබූ රචප්‍රසෝන්ග් දිස්ත්‍රික්කය වනාහී යෝධ තරුපහේ හෝටල්වලින් ද සුඛෝපභෝගී භාන්ඩ මිල දී ගැනීමට බැංකොක් නගරයේ සල්ලිකාරයන් ගැවසෙන මහා සල්පිල් වලින් ද පිරුනු ස්ථානයකි. ප්‍රමුඛ බැංකු සහ සමාගම් මධ්‍යස්ථාන ද එහි ඇත.

විරෝධතා දැක්වීමට පැමිනි බොහෝ දෙනා රටේ අතිදිලිඳු උතුරින් හා ඊසානදිගින් ආ කුඩා ගොවියෝ ය; කුඩා දේපල හිමියෝය. නාගරික දිලින්දන් කන්ඩායමක් ද එයට එකතු වී සිටියෝය. විරෝධතා වාඩිය හමුදාව විසින් කඩා බිඳ දැමීමෙන් පසු කෝපයට පත් පෙලපාලිකරුවෝ අවට තිබුනු ධන සම්පත් සහ වරප්‍රසාද සංකේතයන්ට පහර දුන්හ. කොටස් වෙලඳපලට ද සෙන්ට්‍රල්වර්ල්ඩ් නමැති සල්පිල් සංකීර්නයට ද අහල පහල වෙනත් ගොඩනැලිවලට ද ගිනි තැබූහ.

විරෝධතාවය පැතුරුනු පසුගිය සති කීපය තුල ලෝකය පුරාම ආන්ඩු තායිලන්තයේ උග්‍රවන්නා වූ රාජ්‍ය හමුදා ප්‍රචන්ඩත්වය ද ඉහල යන මරන සංඛ්‍යාව ද නිශ්ශබ්දව බලා සිටියහ. පසුගිය සතියේ හමුදා වෙඩික්කාරයෙක් විරෝධතා කඳවුරට එක්ව සිටි හිටපු ජෙනරාල්වරයෙකුට මරනීය වෙඩි පහර එල්ල කල කල්හි ද එම නිශ්ශබ්දතාවය පැවතුනි. ඇමරිකා එක්සත් ජනපදයේ පාලනාධිකාරය පොදුවේ ප්‍රචන්ඩත්වය හා ජීවිත හානියට එරෙහිව ප්‍රකාශයක් නිකුත් කලේ විරෝධතාකරුවන් තලාදමනු ලැබූවාට පසුව ය. එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ කථක ගෝර්ඩන් ඩුගුයිඩ් තායි ආන්ඩුව හෝ හමුදාව හෙලා දුටුවේ නැත; එහෙත් ධනය සහ පුද්ගලික ලාබයේ සංකේතවූ ගොඩනැගිලිවලට ගිනිතැබීම ගැන ඔහු විරෝධතා කරුවන්ට දොස් පැවරීය. එවන්ම පිලිවෙතක් ගත් ඕස්ට්‍රේලියාවේ විදේශ කටයුතු ඇමති ස්ටීවන් ස්මිත් ද "ප්‍රචන්ඩත්වය හා ජීවිත හානිය ගැන කනගාටුව" පලකලේ ය; විරෝධතාකරුවන් මැඩලීමේදී "ඉවසීමෙන්" කටයුතු කිරීම ගැන තායි හමුදාවට ප්‍රශංසා කලේ ය. ජීවිත හානිය තමාට "ගැඹුරු ශෝකයක් දනවන්නේ" යයි ප්‍රකාශ කල යුරෝපා සංගමයේ විදේශකටයුතු ප්‍රධාන කැතරින් ඇෂ්ටන් "දැන් ඉතින් ජාතික සමඟන් කිරීම පරම අවශ්‍යතාවය බවට පත්ව ඇතැයි" කියා සිටියා ය. "ප්‍රචන්ඩත්වයට පැනගන්නේ නැතිව" ආන්ඩුව සමග එක්ව වැඩ කරන ලෙස ද ඈ විරෝධතාකරුවන්ගෙන් ඉල්ලා සිටියා ය. ගතවූ සතියේ මරනලද 80 කට වැඩි සංඛ්‍යාව පිලිබඳව මොනම බලවතෙක් වත් අගමැති අභිසිත් වේජ්ජජීවා හෝ හමුදාව හෙලාදැක නැත. මැරුම්කෑ වැඩි දෙනෙක් නිරායුධ විරෝධතාකරුවන්ය.

තායිලන්තය තුල පන්ති ආතතීන් පුපුරා ගොස් ඇත්තේ විකෘති සහ පරස්පරවිරෝධී ස්වභාවයකිනි. විරෝධතාවයන්ට තායි කම්කරු පන්තිය විශාලවශයෙන් එක්වූයේ නැත. කම්කරුවන් යම් තරමකට හෝ සහභාගි වූයේ කුඩා ගොවියන්, වෙලෙන්දන්, තොරොම්බල්කරුවන් සහ ගම්බද සුලුවෙලෙන්දන් ගෙන් සමන්විත වූ දේශපාලනිකව ව්‍යාකුල "රෙඩ්ෂර්ට්" ව්‍යාපාරයේ පංගුකරුවන් ලෙසය.

ඔවුන් මෙහෙයවුනේ දක්ෂිනාංශික ජනතාවාදී ටෙලිකොම් ධනකුවේරයකු වූ හිටපු අගමැති තක්ෂින් ෂිනවාත්‍රා සමග බැඳුනු යූඩීඩී ව්‍යාපාරය යටතේය. 2006 දී හමුදා කුමන්ත්‍රනයකින් තක්ෂින් ෂිනවාත්‍රා බලයෙන් පහකෙරුනු තැන් පටන් ඔහු පාලක ප්‍රභුව තුල සිටිනා තම විරුද්ධවාදී කන්ඩායම් සමග පිල් බෙදී කටුක දේශපාලන ගැටුමක ගිලී සිටී.

රටක පාලක පන්තිය තුල පිල් බෙදීම් වඩා පලල් සමාජ විරෝධතා ව්‍යාපාරයකට දොර හැර දුන් මුල්වතාව මෙය නොවේ. පාලක පෙලැන්තියේ පිල්බෙදීම්වලට ගිනි අවුලා ඇත්තේ උග්‍රවන්නා වූ සමාජ අර්බුදය විසිනි. පෝසතුන් හා දුප්පතුන් අතර ඝෝර අගාධයක් ලෙස මෙම සමාජ අර්බුදයම වඩාත් ගැඹුරු ප්‍රකාශනයක් අත්පත් කරගෙන ඇත. පූර්න සංඛ්‍යාලේඛන හැටියට ගත්කල තායිලන්තයේ දරිද්‍රතාවය අඩුවී තිබුන ද ශ්‍රම වේදිකාවක් ලෙස, ගෝලීකෘත ලෝක නිෂ්පාදන සන්තතීන් තුලට රට ඒකාග්‍ර කිරීම මගින් සමාජ විභේදය තවතවත් උග්‍ර කර තිබේ.

මෙම මස නිකුත් කරන ලද 2009 එක්සත් ජාතීන්ගේ මානව සංවර්ධන වාර්තාව (යුනයිටඩ් නේෂන්ස් හියුමන් ඩිවෙලොප්මන්ට් රිපෝට්) අනුව තායිලන්තය ආසියාවේ වඩාත් දැඩි අසමානතාවෙන් පෙලුනු රටක් වේ. එරට ජනගහනයෙන් ඉහලම සියයට 20 ජාතික ආදායමෙන් සියයට 55ක් අත් කර ගති. දුප්පත්ම සියයට 20ට ලැබුනේ ඉන් දහතුනෙන් පංගුවක් තරම් වූ සියයට 4.3කි. යුරෝපයේ හෝ උතුරු ඇමරිකාවේ දී මෙම පරතරය පස්ගුනයක් හෝ අටගුනයක් වෙයි. අග්නිදිග ආසියාවේ සෙසු රටවල එය නමගුනයක් හා එකොලොස් ගුනයක් අතරය. 2008-09 මූල්‍ය කලබැගෑනියෙන් තායි ආර්ථිකය තාවකාලිකව ගොඩ ආ නමුත් එහි වාසිය සමසේ පැතිරී ගොස් නැත. නය අහේනිය මගින් කෙලින්ම පහරට ලක් වී ඇත්තේ වඩාත් නයගැති කුඩා ගොවීන් ද සුලු ඉඩම් හිමියන් ද වේ.

තක්ෂින් ආන්ඩුව ඉවත්කර දැමීම ගැන හමුදාව කෙරේ පැවති විරුද්ධත්වය දැන් රාජාන්ඩුවට ද අධිකරනයට ද හමුදාවට ද පලල් වශයෙන් රටේ සම්ප්‍රදායික ප්‍රභුපෙලැන්තියට ද එරෙහිව එල්ලවූ එකක් ලෙස කැටිගැසී ඇත. විරෝධතාවයට හවුල් වූ එක් ගැහැනියක් බ්‍රහස්පතින්දා *නිව්යෝර්ක් ටයිම්ස්* පුවත්පතට මෙසේ කීවාය: "අවුරුදු සියගනනක්, නැහැ අවුරුදු දහස් ගනනක් අපි දිලිඳුබවේ ගැලී සිටියෙමු. උන් ජීවත් වන්නේ අරුමෝසම් නිවාඩු නිකේතනවල සහ මහ මන්දිරවල ය. ඕකුන් අපට දිග කාලයක් තිස්සේ කලේ මේ ටිකයි." ඇමරිකා එක්සත් ජනපදයේ ද ඕස්ට්‍රේලියාවේ ද යුරෝපා සංගමයේ ද වෙනත් රටවල ද පාලක පෙලැන්තිය අභිසිත් ආන්ඩුවේ මිල්ටරි මර්දනයට හා පොලිස් රාජ්‍ය පියවරයන්ට හීන්නුලෙන් දක්වන සහයෝගයට ලොකු තේරුමක් තිබේ.

ගෝලීය ආර්ථික අර්බුදයේ දෙවන අදියර දරනහරිත්ම ලෝකය පුරාම පන්ති ආතතීන් ද උග්‍රවෙමින් පවතී. බැංකු සහ මූල්‍ය ජාවාරම්කරුවන් බේරාගැනීම සඳහා ආන්ඩු විසින් යොදවන ලද දැවැන්ත ඇප මුදල් සහ උත්තේජන පොදි වල වියදමට, වැඩ කරන ජනතාව කර ගැසිය යුතු යයි පාලකයෝ බලකර සිටිති.

තායි විරෝධතාවන් අවුලුවාලූයේ එන්න එන්නම උග්‍රවන සමාජ අසමානතාවය විසිනි. මේ අතර ග්‍රීසියේ ද, යුරෝපීය සංගමය සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල නියම කල ම්ලේච්ඡ කප්පාදු වැඩපිලිවෙල ආන්ඩුව විසින් ක්‍රියාත්මක කිරීම පලල් විරෝධතා හා වැඩ වර්ජන පැනනංවා ඇත.

පාලක පන්තියේ මේ මර්දන විධික්‍රම තායිලන්තය වැනි ඊනියා තුන්වන ලෝකයේ රටවලට පමනක් සීමාවනු ඇතැයි වරද්දාගතයුතු නැත.

මීට අවුරුදු 20කට පෙර ද තායි හමුදාව නිරායුධ පෙලපාලිකරුවන්ට වෙඩි තැබුවේය. එයින් පසු ඇතිකරන ලද නිෂ්පාදනයේ ගෝලීයකරනය මගින් සිඩ්නි, ලන්ඩන් හා නිව්යෝර්ක් බඳු නවීන මහා නගරයක්, වානිජ මධ්‍යස්ථානයක් හා ජාත්‍යන්තර ප්‍රවාහන කේන්ද්‍රයක් බවට බැංකොක් නුවර පරිවර්තනය කර ඇත.

තායිලන්තය තුල පාලකයන් මිල්ටරි බලය පාවිච්චි කිරීම මගින් පෙන්නුම් කෙරෙන්නේ පන්ති ආතතීන්ගේ සැර පිටකර පාලනය කර තැබීම සඳහා යොදාගන්නා ලද සකල ආරක්ෂක කපාට වියැකී ගොස් ඇති බවය; පාර්ලිමේන්තුව, උසාවි, රාජාන්ඩුව පමනක් නොව (විරෝධතාවයේ මුල් තැන ගත්) යූඩීඩීය සහ විරුද්ධ පක්ෂයන් වැනි සියලුම එවන් කපාට මහජනයාට අපෝවී තිබේ. තායිලන්තයේ පමනක් නොව ග්‍රීසිය තුල ද වෙනත් රටවල ද පාලක පන්තීන් පය ගසාගෙන සිටින මෙවන් දේශපාලන යාන්ත්‍රනයන් සියල්ල එසේම එලිදරව් වී ගොස් ඇත. පන්ති අරගලයන් පැනනගින තතු තුල එම යාන්ත්‍රනයන් අන්තයටම වියැකී යනු ඇත.

තායි ආන්ඩුව විරෝධතාකරුවන්ට වෙඩි තබා මරනකල්හි සෑම පාලක කවයක් ම දැක්වූ නිෂ්ශබ්දතාවය වනාහී ලාභ ගරන ධනපති ක්‍රමය වැඩකරන ජනතාවගේ නැගිටීම් ව්‍යාපාරයක් විසින් තර්ජනයට ලක්වූවිට ඒ හා සමාන මර්දනකාරී පියවරයන් ගැනීමට ලෝකයේ සෑම තැනක ම පාලක පෙලැන්තීන් සූදානම්ව සිටින බවට කම්කරුවන්ට කරන ලද දරුනු අනතුරු හැඟවීමකි.

පීටර් සිමන්ඩ්ස්

© www.wsws.org